අපේ ප්‍රින්සිපල්' අද සිට ප්‍රදර්ශනය අරඹයි

නිරෝෂන් ප්‍රේමරත්න

මව්පියන්ගේ අවධානය ගිලිහීම, මත්ද්‍රව්‍ය, ප්‍රේම සම්බන්ධතා හේතුවෙන් සිදුවන ළමා ගැබිගැනීම් ආදී පාසල් දරුවන් මුහුණ දී ඇති බේදනීය තත්ත්වය සමාජයට අවධාරණය කර ගැනීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස බිහිවූ ක්‍රිස් ඇන්ටනිගේ අපේ ප්‍රින්සිපල්' සිනමා නිර්මාණය හෙට (15දා) සිට EAP මණ්ඩලය ප්‍රමුඛ දිවයින පුරා සිනමා ශාලාවලදී ප්‍රදර්ශනය කෙරේ.

ගුරුවරුන්ගේ හා පාලනාධිකාරියේ මෙන්ම දෙමාපියන්ගේද නොසැලකිලිමත්භාවය හේතුවෙන් මෙන්ම මත්ද්‍රව්‍ය ඇතුළු දේ බෙදාහරින කල්ලිවල ක්‍රියාකාරීත්වයද හමුවේ විනාශ වන ගමක පාසලට පැමිණි නවක ක්‍රියාකාරී විදුහල්පතිනිය ඉතා අසීරු අභියෝගාත්මක තත්ත්වයක් තුළ, දරුවන්ගේ ජීවිත මෙම අවදානමෙන් මුදවා යහපත් තත්ත්වයකට රැගෙන ඒමේ ප්‍රයත්නයක නිරත වන්නීය. එහි ප්‍රතිඵලයක් ලෙස පළාතේ හොඳම හා විනයගරුකම පාසල බවට එම පාසල පත්කිරීමට ඇයට හැකියාව ලැබේ.

දිල්හානි ඒකනායක, රොජර් සෙනෙවිරත්න, ජගත් චමිල, ෂාමි ප්‍රනාන්දු, රුක්ෂාන්ති පෙරේරා, සමන්ත කුමාර ගමගේ, චමින්ද බටුකොටුව, හිරන්ත ප්‍රේමවර්ධන, නයනා රඹුක්කනගේ, දුනිෂා පියුමි ඇතුළු ප්‍රවීණ හා නවක රංගන ශිල්පීන් හා ශිල්පිනියන් රැසකගේ දායකත්වයෙන් නිර්මාණය වූ අපේ ප්‍රින්සිපල්' කතාව හා තිර රචනය අධ්‍යක්ෂණය ක්‍රිස් ඇන්ටනි ගෙනි.

අපේ ප්‍රින්සිපල්' කැමරා අධ්‍යක්ෂණයෙන් විශ්වජිත් කරුණාරත්න, සංස්කරණයෙන් ශාන් අල්විස්, සංගීත අධ්‍යක්ෂණයෙන් සශින් ගිම්හාන් පෙරේරා, සහාය අධ්‍යක්ෂණයෙන් ප්‍රදීප් කේ රාජපක්ෂ, කලා අධ්‍යක්ෂණයෙන් අරුණ ඩයස්, අංග රචනයෙන් මනනුවන් රූපසිංහ ආදීන් දායක වී තිබේ.

පී. ගුණපාල වීරසිංහගේ 'නාට්ටාමිගේ මානව දයාව' එළිදකී

සාකල්‍යා සඳමාලි

පී. ගුණපාල වීරසිංහ මහතාගේ තෙවැනි කෙටි කතා සංග්‍රහය වන 'නාට්ටාමිගේ මානව දයාව' කෘතිය පසුගියදා එළිදක්වනු ලැබිය. එකිනෙකට වෙනස් තේමාවන් යටතේ නිර්මාණය වූ 'නාට්ටාමිගේ මානව දයාව' කෘතිය කෙටි කතා 12කින් සමන්විත වේ. පී. ගුණපාල වීරසිංහ මහතා මීට පෙර කෙටි කතා ද්විත්වයක්, ළමා නවකතා 4ක් හා යොවුන් නවකතා 3ක් එළිදක්වා තිබේ. 'නාට්ටාමිගේ මානව දයාව' කෙටි කතා සංග්‍රහය කර්තෘ ප්‍රකාශනයකි.

ආනයන හා අපනයන පිළිබඳ ග්‍රන්ථය දොරට වඩී

කඩුවෙල - ආසිරි දමින්ද

කර්මාන්ත ගයාන් දැදිගම මහතා රචනා කළ ආනයන හා අපනයන පිළිබඳව ලංකාවේ ප්‍රථම වරට නිකුත් කළ ග්‍රන්ථය එළිදැක්වීම පසුගියදා සිදුකෙරුණු අතර, එහි මුල්ම පිටපත ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට කර්තෘ විසින් පිළිගැන්විණි. ආනයන හා අපනයන පිළිබඳ මූල සිටම අවශ්‍ය උපදෙස් හා නීතිරීති මෙම ග්‍රන්ථයේ සඳහන් බව කර්මාන්තකරුවරයා වැඩිදුරටත් පැවසීය.



'රයිඩර්' හෙට සිට රිද්මා මණ්ඩලයේ සිනමා ශාලාවලදී

සාකල්‍යා සඳමාලි



සිනමාව හා පුංචි තිරය ජයගත් නළු රජිත හිරාන් චාමිකරගේ කුළුඳුල් සිනමා අධ්‍යක්ෂණය වන 'රයිඩර්' හෙට (15දා) සිට රිද්මා මණ්ඩලයේ සිනමා ශාලාවලදී තිරගත වීමට නියමිතය. මෙහිදී රජිත හිරාන් අධ්‍යක්ෂකවරයෙකුට අමතරව පිටපත් රචකයෙකු හා ගීත රචකයෙකු ලෙසින්ද ප්‍රේක්ෂකයා හමුවට පැමිණීම විශේෂත්වයකි.

සදේශ් නමැති යුක්තිය වෙනුවෙන් පෙනී සිටින විශ්වවිද්‍යාල සිසුවෙකු වටා ගෙතුණු රයිඩර්හි රංගන දායකත්වය සනත් ගුණතිලක, රොෂාන් රණවන, රජිත හිරාන් සේනානායක, විලි තිලංග, රයන් වැන්රෝයන්, දසුනි සෙනෙත්මා, සරත් කුලාංග, ෆෙරොලින් ජස්ටින්, නිෂානි තෙන්නකෝන්, සනත් නිශාන්ත, ජයරත්න ගලගෙදර, ප්‍රියන්ත ධර්මශිලි, රංග සම්පත්, සඳරු කොෂාල් කුමාරසිංහ, රොහාන් පෝල්, මන්දාකිනී ආදිත්‍යා, නිලු සෙව්වන්දි, තාරා කළුආරච්චි, අනිල් ජයසිංහ, භාග්‍ය සම්පත්, සුපුන් සත්සර බණ්ඩාර, සේසිරි එම්. සෙනෙවිරත්න ඇතුළු පිරිසකගෙනි.

අනුෂ්ක ඉඳුනිල් රයිඩර් වෙනුවෙන් සිය නිෂ්පාදන දායකත්වය සපයයි.

විරෝධතාවකදී අත්අඩංගුවට පත්වන සදේශ් අමාත්‍යවරයෙකුගේ ලේකම්වරයෙකු ලෙස කටයුතු කරන ඔහුගේ මාමා විසින් බේරාගන්නා නමුත්, සදේශ්ගේ පියා සමග ඇති වූ ආරවුලක් හේතුවෙන් මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයෙකු වෙත යොමු කරවයි. මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට පත්වන සදේශ් සොයා යන ඔහුගේ පෙම්වතිය, මිතුරන් හා මාධ්‍යවේදිනියක මාර්ගයෙන් සියලු තොරතුරු අනාවරණය කර ගනී. අනතුරුව සදේශ්ගේ මාමා විසින් මාධ්‍යවේදිනිය පැහැරගන්නා අතර, සෙසු සියලු දෙනා ඝාතනය කරයි. මේ බව දැනගන්නා සදේශ් හිරෙන් පැන යන අතර, ඔහුට සියල්ල විසඳගෙන මාධ්‍යවේදිනිය බේරාගත හැකිද යන්න වටා 'රයිඩර්' ගොඩනැගී තිබේ.

'බලාසිත් රූ' සම්මාන ප්‍රදානෝත්සවය මෙවරත්

'බලා සිත් රූ' කලා පදනමේ 18වැනි සංවත්සරය නිමිත්තෙන් සම්මාන ප්‍රදානෝත්සවය මෙම මස 23වැනි දින සවස 2.00ට හෝකන්දර උතුරු රත්නාරාම විහාරස්ථානයේදී පැවැත්වේ.

එම පදනමේ සභාපති රෝහණ කොස්තා මහතාගේ සංකල්පයකට අනුව පැවැත්වෙන මේ සඳහා ප්‍රවීණ කලාකරුවන්, ගුරුවරුන් සහ පොලිස් නිලධාරීන් රැසක් ඇගයුමට පාත්‍ර වීමට නියමිතය. සීදුව සකුරා සංගීත ප්‍රසංගය රසවත් කරන අතර, මේ සඳහා ජනප්‍රිය ගායන ශිල්පී ශිල්පිනියන් රැසක්ද සහභාගි වීමට නියමිතය.

සම්මාන උලෙළ සංවිධානය විහාරාධිපති, මුලු දිවයිනටම සාම විනිසුරු, විනයාචාර්ය, සද්ධර්ම කීර්ති ශ්‍රී, විචිත්‍රභාෂී, විනයකීර්ති, ලෝකප්‍රචාරි, පූජ්‍ය රළපනාවේ අරියසාර හිමි.



'වීරයා' දිවයින පුරා සිනමාහල්වලදී ළඟදීම..

සාකල්‍යා සඳමාලි

දේපළ, පැලැන්තිය වැනි කාරණා මත පවුල් දෙකක බල අරගලයක් හා ඊට ගොදුරු වූ දියණියක වටා ගෙතුණු 'වීරයා' සිනමා නිර්මාණය නුදුරේදීම ප්‍රදර්ශනය ආරම්භ වීමට නියමිතය. සුනිල් අරුණ වීරසිරිගේ කතාව, නිෂ්පාදනය හා අධ්‍යක්ෂණයෙන්ද, කාන්ති වීරසිරි විධායක නිෂ්පාදනයෙන්ද වීරයා සිනමා නිර්මාණය එළිදකී.

පවුලක එකම දියණිය පියා අහිමි වීමෙන් පසු ඇගේ මව විසින් ලොකුමහත් කරන අතර, එතෙක් නොගැළපෙන විවාහයක් කරගැනීම නිසා සිය සොහොයුරාගෙන් හා පවුලෙන් ඈත්ව සිටි එම දැරියගේ නැන්දනිය, දේපළ ලබාගැනීම අරමුණු කරගෙන මෙම දැරිය තමා සමීපයට ගෙන්වා ගනී. ඉන්පසුව ඇගේ මව පිළිබඳවත් කෝපයක් හා කලකිරීමක් ඇය තුළ ඇති කරවන්නට උත්සාහ ගන්නා අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇය හිතුවක්කාර මුරණ්ඩු දැරියක ලෙස හැඩී වැඩේ. විදේශගතව සිට ලංකාවට පැමිණෙන ඇගේ පියාගේ මිතුරෙකු, මෙම දියණිය නොගැළපෙන සම්බන්ධයක් ඇතිකර ගෙන ඇති බව දැනගෙන, එය ඇගේ මව හා නිවසේ විශ්වාසවන්ත රියදුරෙකු හා එක්ව නවතා දැමීමට කටයුතු කරයි. පසුව වීරයා නමැති එම රියදුරුට එම තරුණිය විවාහ කරදෙන්නේ ඇගේ දැඩි අකමැත්ත මත වන අතර, එහෙත් ඊට මුහුණ දෙන වීරයා කාලයත් සමග ඇගේ හිත දිනාගැනීමටද සමත් වෙයි.

ජගත් චමිල, ශේෂාද්‍රි ප්‍රියසාද්, ලකී ඩයස්, ශ්‍රියානි අමරසේන, නිරෝෂන් විජේසිංහ, දුලිකා මාරපන, ඇන්ජලා රාජපක්ෂ, සුජානි මේනකා, රමණ වනිගසේකර, රොෂාන් වීර්ණකුල, සරත් කොතලාවල, කුමාර තිරිමාදුර, ඇන්ටන් ප්‍රදී, සරණපාල ජයසූරිය, ඇතාංග ගුණවර්ධන, නෝමන් පලිහවඩන යන ප්‍රවීණ නළු නිළියන් හා නවක නළු නිළියන් රැසක් වීරයා චිත්‍රපටය සඳහා රංගන දායකත්වය දක්වා තිබේ.

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදයේ 19වන දිනය සඳහා වන විවාදය ඊයේ(13දා) පැවැත්වුණි. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වුණු අතර, එහිදී පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් මෙලෙස අදහස් පළ කළහ.

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදය

19වැනි දිනය

දිනේෂ් සමරකෝන්

ජනාධිපති කිව්ව ගමනාන්තයට ළං වෙද්දි ලංකා මැණියන් අභාවප්‍රාප්ත වෙලා තිබුණොත් වැඩක් නැහැ

සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා

IMF එකේ දෙවැනි සංචිතය ලබාගැනීමට හැකි වීම සම්බන්ධයෙන් රටේ ජනතාව වෙනුවෙන් ...

IMFගැන විපක්ෂය නැගූ චෝදනාවලට උත්තර ලැබිලා තියෙනවා

මුදල් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ

මීට පෙර මොනවද කිව්වේ. එකක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න, ගියාට ශ්‍රී ...

ප්‍රේමදාස

මෙතනදි සඳහන් වුණා අභියෝගවලට බය වුණා කියලා. එකකට නම් බය වුණා. හොරු එක්ක, රට බංකොලොත් කළ කණ්ඩායමක් එක්ක ආණ්ඩු කරන්න අපි බය වුණා. ඒක අපි පිළිගන්නවා. දැන් අපිට ඇහුණා කියනවා වැල් පාලමෙන් ගමනක් ගියාලු. මහින්ද රාජපක්ෂව, ගෝඨාභය රාජපක්ෂව, බැසිල් රාජපක්ෂව, නාමල් රාජපක්ෂව ...

ගන්නේ නැතිව රටේ ආදායම හොයන්නම් කියලා කියනවා. මේ සුරංගනා කතාවලින් මම හිතන්නේ නෑ අපේ රට ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙයි කියලා.

මේ රට ගොඩනගන්න නම් ජාතිය අලුතින් අවදි කළ යුතුයි

ජාතික ජනබලවේගයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක

මැජික් ශෝක්ස් අපිට පෙන්නලා මේ තත්ත්වයෙන් ගොඩ එන්න අපිට පුළුවන්කමක් නැ

වැල් පාලම් හෙවෙයි මෙහා පාලමකින්වත් ගිහින් රට බංකොලොත් කරපු හොර කල්ලියක් සමග මධ්‍යමය ගත කරන්න සූදානම් නෑ

විපක්ෂනායක සජිත්

... අපිට ඕන අපේ ලක් මාතාවගේ ජීවිතය බේරගෙන, අපේ ජනතාවගේ ආර්ථික තත්ත්වය ගොඩගෙන ගමනාන්තය දක්වා යන්න.

... අපිට පුළුවන්කමක් නැහැ. මැජික්කාරයෝ හරියට ඉන්නවා. මැජික්කාරයෝ කියන්නේ අපි ආවම මේවා මොනවත් ඕන නැහැ, අපි ඔක්කොම කරලා දෙන්නම් කියනවා. පඩි වැඩි කරලා දෙන්නම්, වැට් ...

රටේ අද්‍යාපම් විකමනාට සඳහා රජය කටයුතු කරන්නේ නැති එක බරපතළ ප්‍රශ්නයක්

... නිසා මේ රටේ අද එක පැත්තකින් තුන් වේලෙන් එක වේලක් කන්න බැරි මිනිස්සුත් ඉන්නවා. අනිත් පැත්තෙන් තමන්ගේ චොපර් එක, තමන්ගේ ජෙට් එක සිංගප්පූරුවට යවලා, මැලේසියාවට යවලා තමන්ට සතියේ කන බොන දේවල් ගන්න පිරිසකුත් මේ රටේ ඉන්නවා. ඔවුන්ගේ වරප්‍රසාද අහිමි කරන්න නෙවෙයි මම කියන්නේ. ව්‍යාපාරිකයන් දියුණු විය යුතුයි. නමුත් මේ ආදායම් විෂමතාව සඳහා රජය මේ වගේ තත්ත්වයක් තියෙන වෙලාවක අත තියන්නේ නැත්තේ ඇයි කියන කාරණය බරපතළ ප්‍රශ්නයක්.

ඉදිරියේදී කවුරු රාජ්‍ය බලය ගන්න උත්සාහ කළත් IMF කොන්දේසි අනුව වැඩ කරන්න ඕන

ප්‍රවාහන හා මහාමාර්ග සහ ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන

ඉස්සරහට කවුරු රාජ්‍යයක් ගන්න උත්සාහ කළත් මෙහෙම කරන්න ඕන. රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් 95%ට වඩා අඩු වීම, විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙන් පසු අවධිය තුළ දළ මූල්‍යනය අවශ්‍යතා 2027-2032 කාලය තුළ මධ්‍යම රජයේ වාර්ෂික මූල්‍යනය අවශ්‍යතා, දළ දේශීය නිෂ්පාදනයෙන් 13%ට වඩා පහළ මට්ටමක පැවතීම. ඒ නිසා මේවා කරන්න බැරි නම් කාට හරි ආණ්ඩුවක් ගන්න කෙනෙකුට, ඒ ආණ්ඩුව මේ කොන්දේසි කඩ කළාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ...

කුම්බලා මාළු කෑවා නම් දිරවපන් බලලෝ වගේ, IMF කියන විදියට යනවා නම් දිරවපන් බලලෝ කියලා නමයි අපිට කියන්න වෙන්නේ

පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ

... ටිකක් බෙල්ල හිර කළොත් තමයි.

දිනේෂ් සමරකෝන්

වැල් පාලමෙන් එගොඩ වුණත් මෙතැනින් ඉස්සරහට තියෙන්නෙ වංකගිරියක්

සමහරු කතා කරනවා විතරයි, විවේචනය කරනවා විතරයි, නමුත් මම ප්‍රතිඵල පෙන්නුවා

බිඳවැටුණු ශ්‍රී ලංකා ආර්ථිකය නැවත ගොඩනැගීමට ආණ්ඩුව ගෙන යන වැඩපිළිවෙළ හැර වෙනත් මගක් නොමැති බවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය බිඳ දැමුවහොත් මුළු රටම නැවත කඩාවැටෙන බවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය. පාර්ලිමේන්තුවේදී ඊයේ (13දා) විශේෂ ප්‍රකාශයක් කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

"අද මම මේ ගරු සභාව අමතන්නෙ ලොකු සතුටකින්. රට යළි ගොඩනැංවීමේ විස්තීරණ ණය පහසුකමේ දෙවැනි වාරිකය අනුමත කළ බව මීට සුළු ...

... ජීවන ප්‍රශ්න ඇති වුණා. මා ගත් සමහර දුෂ්කර තීරණ රටේ ජනතාව අපහසුවෙන් වුණත් විඳ දරා ගත්තා.

ඒ සියලු දුක් විඳින්න වුණේ රට බංකොලොත් බවින් මුදවා ගැනීම සඳහායි. අපි සියලුදෙනා විඳි දුක් කරදර සහ කැපවීම් නිසා රට බංකොලොත් බවින් මුදවා ගන්න දැන් අපට අවස්ථාව ලැබී තියෙනවා.

මම කලිනුත් කිව්වා වගේම රටේ බහුතර ...

... කිරීම ඇතුළුව හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යම් ප්‍රමාණයක සාර්ව ආර්ථික ස්ථායීකරණයක් ගෙන ආවේය.'

හර්ෂ මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි දැන් අපට යම් ප්‍රමාණයක ආර්ථික ස්ථාවරත්වයක් ලබා ගන්න පුළුවන් වෙලා තියෙනවා.

ඇත්තම කීවොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ...

... කියන්නේ සියල්ල සර්ව සම්පූර්ණ වුණා කියන එක නෙවෙයි. පූර්ණ ආර්ථික නිදහස ලබන්න අප තවත් බොහෝ දුර යා යුතුයි.

ඒ නිසා මම මේ ගරු සභාවේ සිටින සියලුම දෙනාගෙන් නැවත නැවතත් ඉල්ලා සිටින්නේ අප මේ තාක් පැමිණි නිවැරදි මාවත ගිලිහෙන්නට ඉඩ නොදෙන ලෙසයි. සමහරු කතා කරනවා ...



ජනමාධ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙලේදී විජය පුවත්පත් සමාගමට සම්මාන 18ක්

වසරේ හොඳම සෞඛ්‍ය රැකවරණය හා වෛද්‍ය තොරතුරු වාර්තාකරණයට හිමි සම්මානය 'ලංකාදීප' පුවත්පතේ මාධ්‍යවේදී මාධවී ධර්මරත්න